**ශීර්ෂය - 05 අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කාර්යාලයේ අභ්‍යන්තර පාලනය සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබොධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ). ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ). සමාලෝචිත වර්ෂය තුළ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු කල්බදු මෝටර් වාහන 06 හි රු.51,340,000 ක් වූ මුළු වටිනාකම,2018 ජූලි 16 දිනැති අංක 03/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 05 (ආ) යටතේ (උ) වගන්තිය සහ 2019 අගෝස්තු 19 දිනැති අංක SA/AS/AA/Circular දරන ලිපිය ප්‍රකාරව ගිණුම් ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වත්කම් වාර්තා කිරීමේදී, අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණය සමග එකඟ වෙමි. අතපසුවීමකින් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගත් වාහන 06 හි සම්පූර්ණ වටිනාකම **CIGAS** වැඩසටහනට ඇතුළත් කර නොතිබුණි. ඉදිරියේදී අදාල වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ). | වටිනාකම රු.51,340,000 ක් වූ කල්බදු වත්කම් (මගී වාහන) මිලදී ගැනීම්, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස දැක්විය යුතු වුවද, ඒ යටතේ වාර්තා කර තිබුණේ රු.3,086,628 ක වටිනාකමක් පමණි. | මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වත්කම් වාර්තා කිරීමේදී, අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණය එකඟ වෙමි. වැරදීමකින් මෙතෙක් ගෙවන ලද කල්බදු වාරිකවල වටිනාකම පමණක් ඇතුළත් කර තිබුණි. |

## 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | 2018 සැප්තැම්බර් 13 සහ ඔක්තෝබර් 30 දින සිදුවී තිබුණු අනතුරු 02 ක් හේතුවෙන් සිදු වී තිබුණු රු.52,369 ක අලාභයන් සහ සමාලෝචිත වර්ෂය තුළ සිදුවී තිබුණු වාහන අනතුරු 05 ක එකතුව රු.386,092 ක අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අවසන් බවට පිළියෙල කළ යුතු වාර්තා 2020 ජුනි 25 දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නැතිවීම්/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හි විධිවිධාන ප්‍රකාරව නියමිත වාර්තා පිළියෙල කර, එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | මෙම අලාභයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ගරු නීතිපතිතුමා වෙත දැනුම් දී ඇති අතර, ඒ සම්බන්ධව මෙතෙක් නිශ්චිත පිළිතුරක් ලැබී නොමැත.<br>වාහන අනතුරු 05 ක අලාභයන් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ වාර්තා සහ අවසන් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ). ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව රු.17,500,000 ක් වූ, අංක 1102 දරන පුනරාවර්තන වැය විෂයය සහ අංක 2001, 2103 දරන ප්‍රාග්ධන වැය විෂයයන් දෙක යටතේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් ගිණුම් ගතවී නොතිබුණු අතර, වර්ෂය අවසානයට එම වැය විෂයයන් 03 යටතේ සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදන ඉතිරිවීම සියයට 100 ක් විය. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | 2019 අප්‍රේල් මස රටේ ඇතිවූ අනපේක්ෂිත සිදුවීම් මත ආර්ථික කටයුතුවලට බාධා එල්ලවීම කරණකොට ගෙන නිකුත් කරන ලද අංක 04/2019 හා 2019.06.17 දිනැති අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය වියදම් දැරීමේදී සිදු කරන ලද වියදම් පාලන ක්‍රම යටතේ වියදම් ඉතිරියක් සිදුවී ඇත. |
| (ආ). 2018 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ශ්‍රාවස්ති ගොඩනැගිලි පරිශ්‍රයේ කොටසක් තුළ කාර්යාලය ස්ථාපනය කිරීම වෙනුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සහ මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.27,820,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.26,450,274 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, එය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 61 ත් 100 ත් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | විගණන නිරීක්ෂණය සමග එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| (ඇ). අමාත්‍ය මණ්ඩල අනුමැතීන් අනුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කාර්යාල පරිශ්‍රයේ වෙනසක් වී නොතිබුණු නමුත්, එසේ අනුමැතිය ලද භාවිතයට නොගත් ගොඩනැගිලි දෙකක් වෙනුවෙන් තත්ත්ව වාර්තා ලබා ගැනීමට, ආරක්ෂක රාජකාරී, ජල සහ විදුලි බිල්පත් වෙනුවෙන් 2017 අගෝස්තු 14 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාර්යාලය විසින් දරා තිබුණු වියදම්වල එකතුව රු.2,423,486 ක් විය. | සැලසුම් සහගතව හා ආර්ථික බවින් යුක්තව වියදම් දැරිය යුතු වේ. | අමාත්‍ය මණ්ඩල කාර්යාලය සඳහා තාවකාලිකව වෙන් කරදී තිබුණු ශ්‍රාවස්ති මන්දිර පරිශ්‍රයේ ගොඩනැගිලි කිහිපය ඇතුළු ඒවායේ සවිකර ඇති උපකරණවල ආරක්ෂාව සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.2,118,900 ක්ද, එම දෙපාර්තමේන්තුවේ සමස්ත ජල හා විදුලි බිල්පත් වටිනාකමින් 5% ක කොටසක් වන රු.188,600 ක්ද, ගොඩනැගිලි තත්ත්ව වාර්තා ලබා ගැනීම සඳහා රු.115,986 ක්ද වශයෙන් එකතුව රු.2,423,486 ක් එම කාලසීමාව තුළ ගෙවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව, 2020 අගෝස්තු 17 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ සහ විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 17 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 09 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 38 | 28 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40 | 29 | 11 |
| (v) | වෙනත් - (අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික) | 06 | 03 | 03 |
| | එකතුව | 119 | 86 | 33 |